# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## ඇබෑර්තු

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පහත සඳහන් ඇබෑර්තු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

## 1. පරිපාලන නිලධාරී (JM1-1) තනතුරු 01 (කොළඹ)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය/ සමාජීය විද්‍යාව/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ විද්‍යාව පිළිබඳ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මාධ්‍ය විභාගය සමත් වී තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "ආශ්‍රිත නිලධාරී" කාණ්ඩයේ තනතුරක (MA3) අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන" (MA1) ශ්‍රේණිය II තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය**

JM1.1 - 01/2025 : රු. [72,650- 1,360X10 -2,040X18=122,970/=]

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 65,633/=

## 2. ගිණුම් නිලධාරී (JM 1-1) - තනතුරු 01 (කොළඹ)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය/ ගණකාධිකරණය/ වාණිජ්‍ය/ කළමනාකරණය හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත් වී තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබාතිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "ආශ්‍රිත නිලධාරී" කාණ්ඩයේ තනතුරක (MA3) අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන" (MA1) ශ්‍රේණිය II තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය**

JM1.1-01/2025 : (72,650 - 1,360X10-2,040X18=122,970/=)

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 65,633/=

## 3. විමර්ශණ නිලධාරී (JM1-1) - තනතුරු 01 (කොළඹ)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අපරාධ විද්‍යාව/ නීතිවේදී (LLB) උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "ආශ්‍රිත නිලධාරී" කාණ්ඩයේ තනතුරක (MA3) අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන" (MA1) ශ්‍රේණිය II තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :**

JM 1.1 - 01/2025 : රු. [72,650-1,360X10-2,040X18=122,970]

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 65,633/=

## 4. දිස්ත්‍රික් ළමා ආරක්ෂණ නිලධාරී (MA3) - තනතුරු 08

**සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජීය විද්‍යා/ සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රථම උපාධියක් හෝ වෙනත් ඕනෑම අදාළ උපාධියක් සහ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතියක වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ළමා හෝ උපදේශන ක්ෂේත්‍රයට අදාළ විෂයන්ගෙන් යුත් එක් අවුරුදු ඩිප්ලෝමාවක් තිබීම අමතර වාසියක් වනු ඇත.

**වයස**

වයස අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය**

MA3 - 01/2025 : රු. [53,940- 800X10-1,190X11-1,320X10 - 1,350X5 = 94,980/=]

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 49,831/=

## 5. දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරී (MA3) තනතුරු 11

**සුදුසුකම්** :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මනෝවිද්‍යාව/ සමාජ විද්‍යාව/ සෞඛ්‍ය ප්‍රවර්ධන/ කථන හා ශ්‍රවණ අවශ්‍යතා/ විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය/ අධ්‍යාපන නාට්‍ය හා රංගකලාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතියික, වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් උපදේශනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් තිබිම අමතර වාසියක් වනු ඇත.

**වයස :**

වයස අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :**

MA3 - 01/2025 : රු. [53,940- 800X10-1,190X11-1,320X10 - 1,350X5=94,980/=]

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 49,831/=

## 6. ගිණුම් සහකාර (MA3) - තනතුරු 02 (කොළඹ)

**සුදුසුකම් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජ්‍ය/ කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත් වී තිබීම සමග වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වයස**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :**

MA3 - 01/2025 : රු. [53,940- 800X10-1,190X11-1,320X10 - 1,350X5 = 94,980/=]

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 49,831/=

## 7. උපදේශන සහකාර (MA3) - තනතුරු 05

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මනෝවිද්‍යාව/ සමාජ විද්‍යාව/ සෞඛ්‍ය ප්‍රවර්ධනය / විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය/ කථන හා ශ්‍රවණ විද්‍යාව/ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ප්‍රථම උපාධිය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තෘතියික හෝ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබාතිබීම අමතර වාසියක් වනු ඇත.

**වයස :**

අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :**

MA3 - 01/2025 : රු. [53,940- 800X10-1,190X11-1,320X10 - 1,350X5= 94,980/=]

**මූලික වැටුප :** 2026.01.01 දිනට රු. 49,831/=

**ඉහත සියලුම තනතුරු සඳහා**

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හිමිවේ. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා පිළිවෙලින් 12%ක සහ 3% ක දායකත්වයක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

**ඉහත සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය**

පත්කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

**පොදු කොන්දේසි (ඉහත සියලුම තනතුරු සඳහා)**

සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් හෙබි අයකු විය යුතු මෙන්ම තනතුරට පැවරෙන කාර්යය මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

අදාළ තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත් පෝරම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය වන www.childprotection.gov.lk වෙතින් බාගත කරගත යුතුය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 මාර්තු 16 වන දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

සියලුම අයදුම්පත් සමග, මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ ඇමතුම් අංක එවිය යුතුය.

යම් අයදුම්කරුවකු එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

අයදුම්පත් බහා එවන කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සහ විභාගයට පෙනීසිටීමට තෝරාගන්නා භාෂාව (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) සඳහන් කළ යුතුය.

රාජ්‍ය අංශයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් මෙන්ම අසම්පූර්ණ සහ අපැහැදිලි අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම තනතුරු ලබාගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාග සහ/ හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති,**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
**අංක 330, තලවතුගොඩ පාර,**
**මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.**

**දුරකථන අංක 0112778911 - 14**
**Web Site - www.childprotection.gov.lk**